# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,727/4 — 1966 දෙසැම්බර් 25 වැනි ඉරිදා — 1966.12.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රේගු නිවේදනය—අංක 61/9/265

ආදායම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1966 දෙසැම්බර් 26 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා මිනැම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ :—

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | | රු. ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට | ... ... | 0 93 |
| මිනැම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට | ... ... ... ... ... | නැත |

අංක ඊ. 781,
1966 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

හේමසිරි ප්‍රේමවර්ධන,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

12–1472

---

### රේගු දැන්වීම—අංක 64/5/125

1964 අගෝස්තු මස 8 වැනි දින අංක 14,138 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1966 දෙසැම්බර් මස 26 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොලෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 187 9/32 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල් තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව<br>රු. ශ. | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව<br>රු. ශ. | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව<br>රු. ශ. | | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව<br>රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 224 89 | — | 178 57 | — | 151 65 | — | 56 22 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඊ. 744/22,
1966 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

හේමසිරි ප්‍රේමවර්ධන,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

12–1471


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1052/23—ආර් ආර් 170—11,200 (66/12)